**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අභිතකර මතය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 22 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව අභිතකර මතය විස්තර කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය. මාගේ මතය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 48 ඡේදය ප්‍රකාරව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවත් පොත් අලෙවිසැලේ විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී වර්ෂයේ ගැණුම් වටිනාකම වූ රු.765,883 ක් විකුණුම්වලින් අඩුකර දක්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් කරුණු සොයා බලා අවශ්‍ය ගිණුම්කරණ නිවැරදි කිරීම 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ආදායම් වියදම් වෙන් වෙන්ව හඳුනා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලද රු.3,250,000ක ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 ප්‍රකාරව වර්ෂයේ ආදායමට හඳුනාගැනීමකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් ගිණුම්ගත කර තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 11 ප්‍රකාරව 2023 වර්ෂයේ සිට ආදායමට හඳුනා ගැනීමට කටයුතු කරනු ලබන බව. | ගිණුම්කරණ ප්‍රමිත අනුව වර්ෂයේ ආදායම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මිලදී ගැනීමේ පිරිවැය රු.2,726,001ක් වූ kiyawamu.lk වෙබ් අඩවිය සහ සංවර්ධනය කිරීමේ පිරිවැය රු.10,397,391ක් වූ ඩිජිටල් එකතු මෘදුකාංගය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 20හි 26 | පිරිවැය රු.2,726,001ක් වූ kiyawamu.lk වෙබ් අඩවිය සහ රු.10,397,391ක් වූ ඩිජිටල් එකතුව අස්පෘශ්‍ය වත්කම් යටතේ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතයේ නිර්වචනයන් පරිදි ස්ෂෘශ්‍ය හා අස්ෂෘශ්‍ය වත්කම් නිවැරදිව හඳුනාගැනීමට |

| | | |
|---|---|---|
| වගන්තිය ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් යටතේ නොදක්වා වෙනත් ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | | කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන පොත් අලෙවිසැලේ රු.2,117,895ක වෙළඳ අලාභයක් වාර්තා වී තිබුණු අතර, විගණන පරීක්ෂාවේදී එය ගණනය කර තිබුණු ආකාරය පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන පොත් අලෙවිසැලේ 2021 දෙසැම්බර් 31 දිනට අවසාන තොගය රු.2,819,907ක් වුවද සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැය ගණනය කිරීමේ දී ආරම්භක තොගය රු.3,444,503ක් ලෙස ගැලපීම හේතුවෙන් විකුණුම් පිරිවැය හා වර්ෂයේ ඌනතාවය රු.624,596කින් වැඩියෙන් දක්වා තිබුණි. | විකුණුම් මිලට ගිණුම්ගතකර පැවති පොත් තොගය පිරිවැයට හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම 2022 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂ ගැලපීම් යටතේ ගිණුම් ගතකර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධ අගය යන දෙකෙන් අඩු අගයට අගය කර ගිණුම්ගත කල යුතුය. |
| (ii) | 2022 දෙසැම්බර් 31 දිනට පොත් අලෙවිසැලේ අවසන් තොගය විගණන පරීක්ෂාව අනුව රු.934,696ක් වුවද, වෙළඳ ගිණුමේ අවසන් තොගය රු.1,104,161ක් ලෙස ගණනය කිරීම හේතුවෙන් විකුණුම් පිරිවැය හා වර්ෂයේ ඌනතාවය රු.169,465කින් අඩුවෙන් දක්වා තිබුණි. තවද, එම තොගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.479,565ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ජංගම වත්කම් රු.455,131ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙ සම්බන්ධයෙන් තවදුරටත් කරුණු සොයා බලා අවශ්‍ය ගිණුම්කරණ නිවැරදි කිරීම 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | තොගය නිවැරදිව ගණනය කිරීමට හා අගය කිරීමට කටයුතු කල යුතුය. |
| (iii) | පොත් අලෙවිසැලේ සම්භාව්‍ය කෘති හා ප්‍රකාශන විකිණීමෙන් ලද ආදායම වූ රු.1,153,672ක් වෙළඳ ගිණුමට ගැලපීමකින් තොරව වෙනත් ආදායමක් ලෙස දක්වා තිබීමෙන් වෙළඳ අලාභය | මෙ සම්බන්ධයෙන් තවදුරටත් කරුණු සොයා බලා අවශ්‍ය ගිණුම්කරණ නිවැරදි කිරීම 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු | වෙළඳ ලාභය/ අලාභය ගණනය කිරීමේදී පොත් අලෙවි ආදායම වෙළඳ ගිණුමේ |

| | | | |
|---|---|---|---|
| | එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ලබන බව. | විකුණුම් ආදායමක් ලෙස දැක්විය යුතුය. |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී අලෙවිසැල විසින් විකිණීමෙන් පසු ගෙවීමේ පදනම මත පිටස්තර කතෘවරුන්ගෙන් ලබාගන්නා ලද රු.362,423 ක් වූ පොත් තොගය ගැනුම් ලෙස හා ණයහිමියන් ලෙස ගිණුම් ගත නොකර අවසාන තොගය වශයෙන් පමණක් ගිණුම්වලට ගෙන තිබුණි. | මෙම සම්බන්ධයෙන් තවදුරටත් කරුණු සොයා බලා අවශ්‍ය ගිණුම්කරණ නිවැරදි කිරීම 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | තෝරාගත් ගිණුම්කරණ ක්‍රමවේදය අනුව නිවැරදිව හා සම්පූර්ණ ද්විත්ව සටහන් තැබිය යුතුය. |
| (v) | සමාලෝචිත වර්ෂයේ පොත් විකිණීමෙන් පසු කතෘන්ට ගෙවන මුදල්, විකුණුම් ගිණුමට හර කර සටහන් කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ කෘති විකිණීමෙන් ලද රු.868,273ක් වූ සත්‍ය ආදායම මූල්‍ය ප්‍රකාශනවල රු.313,739ක් ලෙස දැක්වීම නිසා විකුණුම් රු.554,534කින් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම සම්බන්ධයෙන් තවදුරටත් කරුණු සොයා බලා අවශ්‍ය ගිණුම්කරණ නිවැරදි කිරීම 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ණයහිමියන්ට මුදල් ගෙවීම විකුණුම් ගිණුම මගින් සිදු නොකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී අලෙවිසැලේ අලෙවි වූ පුස්තකාල ලිපිද්‍රව්‍යන්හි රු.211,349ක පිරිවැය අගය, මණ්ඩලයේ පුස්තකාල ලිපිද්‍රව්‍ය තොග ගිණුමට බැර කර තිබීම හේතුවෙන් මණ්ඩලයේ පුස්තකාල ලිපිද්‍රව්‍ය තොගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම සම්බන්ධයෙන් තවදුරටත් කරුණු සොයා බලා අවශ්‍ය ගිණුම්කරණ නිවැරදි කිරීම 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ගණකාධිකරණ මූලධර්ම අනුව ද්විත්ව සටහන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ඇ) | නිත්‍යානුකූල තැන්පතු, පරිත්‍යාග, මිලදී ගැනීම්, හුවමාරු සේවා යනාදී වශයෙන් මණ්ඩලයට ලැබී තිබුණු පොත් එකතුවෙන් රු.115,165,111ක් පමණක්, එනම් මිලදී ගැනීම් සහ 2022 වර්ෂයේ පරිත්‍යාගවලින් කොටසක් පමණක් මූල්‍ය ප්‍රකාශනයන්හි ස්ථාවර වත්කම් ලෙස ඇතුළත් කර තිබුණි. එසේ වුවත් වටිනාකම හඳුනාගැනීමට කටයුතු නොකෙරුණු පොත් හා ප්‍රකාශන තවදුරටත් මණ්ඩලය සතුව ඇතත් එම පොත්වල වටිනාකම මිනුම්කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු බැවින් මණ්ඩලය සතු මුළු පොත්වල වටිනාකමේ නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | KOHA පුස්තකාල කළමනාකරණ මෘදුකාංග පද්ධතිය තුළ මේ දක්වා හඳුනාගෙන ඇති ගැටලු විසඳා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. මෙහි ප්‍රථම අදියර වශයෙන් මෙතෙක් KOHA දත්ත පද්ධතියට ඇතුළත් කර නොමැති පැරණි ප්‍රකාශන කඩිනමින් දත්ත පදනම වෙත ඇතුළත් කිරීම සඳහා ව්‍යාපෘතියක් සකස් කර ඇති බව. | සියළු ආකාරවලින් ලැබෙන පරිත්‍යාග තක්සේරු කර ගිණුම් ගතකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් කාර්යාල ලී බඩු හා උපකරණ සහ පරිගණක හා පරිගණක උපාංගයන්හි 2022 වර්ෂයට අදාල ක්ෂය ප්‍රමාණය පිළිවෙලින් රු.27,135ක් සහ රු.294,788ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව එය පිළිවෙලින් රු.24,446ක් සහ රු.185,749ක් ලෙස පෙන්වා ඇති බැවින් වර්ෂයේ ඌනතාවය හා ස්ථාවර වත්කම් රු.111,728කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඒ පිළිබඳව තවදුරටත් පරීක්ෂා කර බලා ලීබඩු උපකරණ සහ පරිගණක උපාංග සම්බන්ධයෙන් වාර්ෂික ක්ෂය කිරීම් 2023 වසර සඳහා නිවැරදිව ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව. | වාර්ෂික ක්ෂය ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව නිවැරදිව ගණනය කර ගිණුම්ගත කල යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දී සේවා සැපයීම වෙනුවෙන් සෘජුවම බැංකුවට ලද රු.136,161ක් ආදායම් ප්‍රභවය අනුව ආදායමට හඳුනාගැනීමට කටයුතු කර නොතිබීමෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | බැංකුව වෙත ලැබෙන මෙම සෘජු තැන්පතු වන රු.136,161ක මුදල 2023 වර්ෂයේ අවසන් ගිණුම් සඳහා හඳුනාගෙන ආදායමට ගෙන ඇති බව. | කාලපරිච්ඡේදයට අදාල සම්පූර්ණ හා නිවැරදි ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ඊ) | විදේශ ප්‍රදාන ව්‍යාපෘති 03ක 2022 දෙසැම්බර් 31 දිනට රු.454,429ක උපචිත වියදම් ගිණුම්ගත කර තිබුණද ඒ හා සමාන ප්‍රමාණයක් ප්‍රදාන ගිණුමෙන් ඉවත් කර සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස හඳුනානොගැනීමෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද ප්‍රදාන ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි. | විදේශ ව්‍යාපෘති 03ක රු.454,429ක උපචිත වියදම් සම්බන්ධව තවදුරටත් පරීක්ෂා කර බලා අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරනු ලබන බව. | කාලපරිච්ඡේදයට අදාල සම්පූර්ණ හා නිවැරදි ආදායම හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (උ) | විදේශ ප්‍රදාන ව්‍යාපෘතියක් යටතේ සමාලෝචිත වර්ෂය තුල දී මණ්ඩලය විසින් දරන ලද රු.125,000ක වියදම්, අදාල ව්‍යාපෘති ප්‍රදාන ගිණුමට හර කිරීම වෙනුවට මණ්ඩලයේ සම්මන්ත්‍රණ, දේශණ හා පුහුණු වියදම් ගිණුම හර කිරීම හේතුවෙන් විදේශ ප්‍රදානවලින් ලද ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් සහ ව්‍යාපෘති ප්‍රදාන ගිණුමේ ශේෂය හා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ව්‍යාපෘතියට අදාළ රු.125,000 වියදම් සම්බන්ධව තවදුරටත් පරීක්ෂා කර බලා අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරනු ලබන බව. | -එම- |
| (ඌ) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සේවා ලබාගැනීම මත රඳවාගැනීම් (Retention) වටිනාකම රු.527,461ක් වූ අතර 2020 වර්ෂයේදී නිරවුල් කර තිබුණු රු.151,856ක් ද ඒ තුළ ඇතුලත් වී තිබුණු බැවින්, ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය ගිණුම්කරණ නිවැරදි කිරීම 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ගණකාධිකරණ මූලධර්ම අනුව ගනුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු බව හා නිවැරදිව මූල්‍ය ප්‍රකාශන |

| | | | |
|---|---|---|---|
| | | | සකස්කළ යුතු බව. |
| (එ) | සෝමා ජයකොඩි පුස්තකාලය වෙත 2019 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලද ගෘහභාණ්ඩ හා පුස්තකාල පොත් තොගයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු බැවින් ස්ථාවර වත්කම් හා ජංගම වත්කම් එම වටිනාකම්වලින් අඩුවෙන් දක්වා තිබුණි. | සෝමා ජයකොඩි පුස්තකාලය වෙත පරිත්‍යාග ලෙස ලැබී ඇති පුස්තකාල පොත්වල වටිනාකම අගය කර අවසන් වන අතර ගෘහ භාණ්ඩ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව | සියළු පරිත්‍යාග තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

## 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| තොගය | 9,889,852 | 7,859,921 | 2,029,931 | මේ සම්බන්ධයෙන් කරුණු සොයා බලා අවශ්‍ය ගිණුම්කරණ නිවැරදි කිරීම 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | භෞතිකව ගණනය කරන ලද තොගය, තොග වාර්තා සමඟ සසඳා වෙනස්කම් සඳහා හේතු හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (i) | මුදල් රෙගුලාසි 571 | තැන්පතු ගිණුමක අවිනිශ්චිතව තබාගෙන ඇති මුදල් ඉකුත් තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතබා අවස්ථාවෝචිත පරිදි අදාල ගිණුමට හෝ ආදායමට හෝ බැර කිරීම හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවිය | වර්ෂ 2 ඉක්ම වූ රඳවාගැනීම් මුදල් වටිනාකම් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | යුතු වුවත් වර්ෂ 02 ක් ඉක්මවූ එකතු වටිනාකම රු.394,961ක් වූ රඳවාගැනීම් 2022 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | | |
| (ii) | මුදල් රෙගුලාසි 756,757 | 2012 වර්ෂයේ සිට 2025 නොවැම්බර් 30 දක්වා මණ්ඩලයේ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් භෞතිකව සත්‍යාපනය සිදු කර නොතිබුණි. | මණ්ඩලයේ තොග සමීක්ෂණ කටයුතු අදියර වශයෙන් සිදු කරමින් පවතින බව. | වත්කම් වාර්ෂිකව සත්‍යාපන කටයුතු සිදුකර වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කළ යුතුය. |
| (iii) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) | අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යයන් අවසන් කර දින 10ක් ඇතුලත පියවිය යුතු වුවද 2011 වර්ෂයේ සිට 2022 වර්ෂය අවසානය දක්වා ලබා දී තිබුණු එකතු වටිනාකම රු.155,486ක තත්ත්කාර්යය අතුරු අග්‍රිම 19ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. | මෙම අත්තිකාරම් මුදල් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අතුරු අග්‍රිම පියවීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පිරිවැය රු.650,464,392ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව සකස් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | චක්‍රලේඛ විධිවිධාන පරිදි ස්ථාවර වත්කම් ලේඛනය විධිමත් පරිදි පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය | ගිණුම් වර්ෂයක් අවසන් වී දින 60ක් ඇතුලත එහි මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ගිණුම් වර්ෂය අවසන් වී | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2025.09.10 දින විගණනය වෙත ඉදිරිපත් කරන ලදී. 2023 වර්ෂයේ සහ 2024 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කර ඉදිරිපත් | චක්‍රලේඛ විධිවිධාන පරිදි මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා |

| | | |
|---|---|---|
| වර්ෂ 02 මාස 07කට පසුව 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | කිරීම සඳහා මේ වන විට කටයුතු කරගෙන යනු ලබන අතර ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ලබා දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව. | ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.16,959,876ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.20,774,680ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,814,804ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා සමාලෝචිත වර්ෂයේ ලද රු.3,780,000ක දේපල කුලී ආදායම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ පරිග්‍රහණ ලේඛනය ලෙස භාවිතා කිරීමට 2015 වර්ෂයේ සිට ලැබී ඇති පොත් ඇතුලත් කර KOHA නමින් දත්ත පද්ධතියක් හඳුන්වා දී තිබුණු අතර එයට 2015 වර්ෂයට පසු මිලදී ගත් පොත් සහ වෙනත් ආකාරවලින් ලද පොත් වටිනාකම පමණක් ඇතුලත් කර තිබුණි. වටිනාකම සඳහන් නොවූ පොත් 144,766ක් එම දත්ත පද්ධතියට ඇතුලත් කර තිබුණු අතර පද්ධතිය අනුව 2022 දෙසැම්බර් 31 දිනට පොත් තොගයේ වටිනාකම රු.77,337,196ක් විය. එහෙත් මණ්ඩලය සතු සියළු පොත් වටිනාකම් සහිතව දත්ත පද්ධතිය පවත්වාගෙන නොතිබුණු බැවින් එම පද්ධතිය හඳුන්වාදීමේ අරමුණ ඉටුවී නොතිබුණි. | KOHA පුස්තකාල කළමනාකරණ මෘදුකාංග පද්ධතිය තුළ මේ දක්වා හඳුනාගෙන ඇති ගැටලු විසඳා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව හා දැනට මිල නොමැති ප්‍රකාශනවල මිල සැකසීම සඳහා මිල ප්‍රතිපත්තියක් සකස් කර ඇති අතර එය 2022 ඔක්තෝම්බර් මාසයේ සිට ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යනු ලබන බව. | KOHA දත්ත පද්ධතියට සියලු දත්ත නිවැරදිව ඇතුලත් කරමින් යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ජනවාරි 01 දිනට උපයෝජනය නොකළ රු.8,719,917ක ප්‍රාග්ධන ප්‍රදාන ශේෂයක් පැවතියදී 2022 වර්ෂය තුලදී රු.3,250,000ක ප්‍රාග්ධන ප්‍රදාන ලබාගෙන තිබුණු අතර එම ප්‍රදාන කාර්යක්ෂමව උපයෝජනය නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට තවදුරටත් රු.5,888,356ක ශේෂයක් ඉතිරිව පැවතුණි. | 2022 වර්ෂයේ රට තුළ පැවති ආර්ථික අර්බුදය හමුවේ නිසි ක්‍රමවේදයට ප්‍රසම්පාදන කාර්යයන් සිදු කිරීමට නොහැකි වී ඇති බව. | ප්‍රාග්ධන ප්‍රදාන කාර්යක්ෂමව හා අරමුණු ගතව යුහුසුළුව උපයෝජනය කළ යුතුය. |